ජපන් තානාපති කාර්යාලයය

අංක 20 ග්‍රෙගරි පාර කොළඹ 7 ශ්‍රී ලංකාව
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@sltnet.lk

## ප්‍රවෘත්ති නිවේදනය

2011 මාර්තු 10 වන දින

# ත්‍රිකුණාමලය සහ රත්නපුර දිස්ත්‍රිකක්යන්හි ජනතාවගේ ජිවනෝපායන් නගා සිටුවීම සඳහා ජපන් රජයෙන් මිලියන 18ක ආධාර

‘බිම් තලයේ ප්‍රජාව සුරැකීමේ වැඩ සටහන’ (GGP) යටතේ, ත්‍රිකුණාමලය සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි ජනතාවගේ ජිවනෝපායන් නංවාලීම සඳහා ඇමරිකානු ඩොලර් 162,611 (දළ වශයෙන් රුපියල් මිලියන 18ක්) ජපන් රජය විසින් පරිත්‍යාග කර ඇත.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් අවතැන් වූ ප්‍රජාවගේ ජිවිත නංවාලීම සඳහා ඇමරිකානු ඩොලර් 89,995 (දළ වශයෙන් රුපියල් මිලියන 10ක) ක මුදලක්, ‘ශ්‍රී ලංකා සමාජ සුභසාධන කටයුතු සංවර්ධන සමිතිය’ (ASAD) ට වෙන්කර ඇති අතර, ඒ තුලින් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කල ජනතාවගේ කෘෂිකාර්මික සහ ධීවර කටයුතු නංවාලීම සිදුකරනු ඇත. එම ව්‍යාපෘතිය තුලින් වැව් ප්‍රතිසංස්කරණය කිරීම, ධීවර මධ්‍යස්ථානයක් ඉදිකිරීම, වගා ලිං 4ක් ඉදිකිරීම සහ කෘෂිකාර්මික සහ ධීවර ආම්පන්න මෙන්ම බීජ සහ පැල ලබාදීම සිදුකරන අතර, ඒ’මගින් එම ප්‍රදේශයේ පවුල් 1520ක් ඍජුවද, පවුල් 3500ක් වක්‍රවද ප්‍රතිලාභ ලබනු ඇත.

වතු වල ජිවත්වන ප්‍රජාවගේ සනිපාරක්ෂක සහ පාරිසරික තත්වයන් වැඩි දියුණුකරලීම සඳහා ‘ප්‍රජා සංවර්ධන පදනම’ට ඇමරිකානු ඩොලර් 72,616 (දළ වශයෙන් රුපියල් මිලියන 8ක) ක මුදලක් වෙන්කර ඇති අතර, ඒ තුලින් රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වතු තුනක 485ක් පමණ ජනතාවට සහ පාසැල් දෙකක 1500ක් පමණ පාසැල් දරුවන්ට සහ ගුරුවරුන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතිය තුලින් සනිපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමට ද ජල සැපයුම් පහසුකම් වැඩි දියුණු කිරීමට මෙන්ම පාසැල් දරුවන් දැනුවත් කිරීමට ද සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ සාමය නැවත ගොඩනැගීම සහ තිරසාර කිරීමේ අරමුණින්, ජපන් රජය විසින් මේ වන විට උතුරු-නැගෙනහිර මධ්‍යකාලින සහ දිර්ඝකාලින සංවර්ධන ව්‍යාපෘති ගණනාවකට ආධාර කර ඇත. එමෙන්ම කෘෂිකාර්මික සහ ධීවර කර්මාන්ත සංවර්ධන සහ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සඳහාද උපකාර කර ඇති අතර, ඉහල කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය සහ යාපනය ශික්ෂණ රෝහල වැනි විශාල

පරිමාණයේ ව්‍යාපෘති වලටද ‘බිම් තලයේ ප්‍රජාව සුරැකීමේ වැඩ සටහන’ (GGP) යටතේ අධාර සපයා ඇත.

මෙම වැඩ සටහන හරහා සෘජුවම ග්‍රාමීය ජනතාවට ප්‍රතිලාභ ලැබෙන අතර, 2010 වසර තුල (අප්‍රේල් 2010 - මාර්තු 2011 දක්වා) අද අත්සන් කරනු ලබන ව්‍යාපෘති දෙක ඇතුළුව, ව්‍යාපෘති දහයක් සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1.7 ක (දළ වශයෙන් රුපියල් මිලියන 190 ක) මුදලක් ලබාදී ඇත. ග්‍රාමීය ජනතාවගේ සාමාජයීය සහ අර්ථිකමය තත්වයන් වැඩි දියුණුකර, බිම් මට්ටමේ සිට සියළුම ප්‍රජාව අතර සාමය වැඩි දියුණුකර තිරසාර කිරීම, මෙම වැඩසටහනේ මූලික අරමුණයි. එ'මගින් ශ්‍රී ලාංකාව තුල තිරසාර සාමයට මෙන්ම සංවර්ධනයට පිටුවහලක් ලබාදීම ට හැකිවනු ඇත.

‘ශ්‍රී ලංකා සමාජ සුභසාධන කටයුතු සංවර්ධන සමිතිය’ (ASAD) සහ ‘ප්‍රජා සංවර්ධන පදනම’ (CDF) අතර අධාර ප්‍රදානය කිරීමේ ගිවිසුම අත්සන් කිරීම 2011 මාර්තු 10 වන දින ජපන් තානාපති කුනිනෝ තකහෂි මහතා සහ අදාල ආයතන වල නියෝජිතයන් අතර කොළඹ ජපන් තානාපති නිල නිවසේදී සිදුකරන ලදි.

වැඩි විස්තර සඳහා

ආර්ථික සහයෝගිතා අංශය - ජපන් තානාපති කාර්යාලයය
දුරකථන 011-2693831 දිගු අංකය 225
ඊමේල් :cultujpn@sltnet.lk

.